**ශීර්ෂය 302, සමූපකාර සේවක කොමිෂන් සභාව**

**-----------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**1.1 මතය**

**------**

සමූපකාර සේවක කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමූපකාර සේවක කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූලි 30 දින ගණන්දීමේ නිළධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ඔක්තෝම්බර් 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට සමූපකාර සේවක කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

**--------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

-----------------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි

ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශය ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූලධන වැය විෂයයක් සඳහා වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණ අතර මූලධන වැය විෂයයන් 02 ක් සඳහා වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 61 ත් සියයට 75 ත් අතර ප්‍රතිශතයක් ඉතිරි වී තිබුණි. | සැපයුම්කරුවන් විසින් මිල ගණන් ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම, අපේක්ෂිත පරිදි සේවා, කටයුතු සම්පූර්ණ කිරීමට අපොහොසත් වීම සෞඛ්‍ය හේතු මත පුහුණු කටයුතු නොපැවැත්වීම වැනි හේතු නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | ප්‍රතිපාදිත මුදල වර්ෂය තුල උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පුනරාවර්තන වැය විෂයයන් 03 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 68 ත් සියයට 96 ත් අතර ප්‍රතිපාදන ඉතිරි වී තිබුණු අතර තවත් වැය විෂයයන් 10 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8 ත් 48 ත් අතර ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | පැවති සෞඛ්‍යමය හේතු, මනා පාලනයකින් හා අරපිරිමැසුම්දායක ලෙස වියදම් සිදු කිරීම, අපේක්ෂිත පරිදි වියදම් ඇති නොවීම හා ඉදිරිපත් කල ඇස්තමේන්තුවට වඩා ප්‍රතිපාදන අනුමත වීම වැනි හේතු මත ප්‍රතිපාදන ඉතිරි වි තිබුණි. | ප්‍රතිපාදිත මුදල වර්ෂය තුල උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.2. සීමා ඉක්මවීම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුමට විසර්ජන පනත අනුව අවම ලැබීම් සීමාව රු.700,000 ක් වුවද තත්‍ය ලැබීම රු.638,490 ක් වූයෙන් සීමාවට ලඟා නොවීම රු.61,510 ක්ව පැවතියද අවම ලැබීම් සීමාව සංශෝධනය කරගැනීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2020(11) අනුව 2020 අප්‍රේල් සහ මැයි මාසවල අත්තිකාරම් 'බී' ගිණුමෙන් ලබාගත් ණය සඳහා වාරික හා පොළිය අය කිරීම නොකළ බැවින්, අය නොකළ වාරික වල වටිනාකම රු.110,108.00 කි. ඒ හේතුවෙන් විසර්ජන පනත අනුව අවම ලැබීම් සීමාවට ළඟා වීමට නොහැකි වී ඇත.<br><br>අවම ලැබීම් සීමාව සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණු බවට එකඟ වන අතර ඉදිරියේ එවැනි අතපසුවීම් සිදු නොවීමට නිලධාරීන් හට උපදෙස් ලබා දී ඇත. | සීමා සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 2.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.3.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (i) | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය වත්කම් යටතේ මුදල් හා මුදල් සමාන දෑ ලෙස රු.1,414,430 ක් ද, ජංගම වගකීම් යටතේ අග්‍රිම ශේෂය ලෙස රු.1,414,430 ක් ද දැක්විය යුතු වුවද එම අගයන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි. | 2020.11.30 දිනැති භාණ්ඩාගාර මෙහෙයුම් මාර්ගෝපදේශ අංක 6/2020 අනුව 2020.12.31 දිනට මුදල් පොත පියවා පැවති ශේෂය වන රු.1,414,430 ක මුදල මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර ඇත. එබැවින් 2020.12.31 වන දිනට මුදල් හා ඒ සමාන දෑ නොමැති බවත් අග්‍රිම ශේෂයක් නොමැති බවටත් දන්වා තිබුණි. | භාණ්ඩාගාර පොත් අනුව මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය පිළියෙල කළ යුතුය. |

**(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැයකරන ලද මුදල් ප්‍රවාහය ගණනය කිරිමේදී සහනාධාර සහ මාරු කිරීම් වටිනාකම වූ රු.276,336 වෙනම පෙන්විය යුතු වුවද එය පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් ලෙස දක්වා තිබුණි. හැකියා වර්ධනය වෙනුවෙන් දරන ලද රු.89,113 ක වියදම මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැයකරන ලද මුදල් ප්‍රවාහය යටතේ දැක්විය යුතු වුවද එය ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා තිබුණි. | සහනාධාර හා මාරුකිරීම් වටිනාකම වන රු. 276,336/- මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් වියදම් වල ඇතුළත් කර ඇත. ඉදිරි වර්ෂ වල සිට එය සහනාධාර සහ මාරු කිරීම් ලෙස වෙනම පෙන්වීමට උපදෙස් ලබා දෙන ලදි.<br><br>ප්‍රාග්ධන වියදම් ලෙස ලබාදී ඇති ප්‍රතිපාදනයක් වන හැකියා වර්ධනය වෙනුවෙන් දරන ලද රු.89,113 ක වියදම භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම හා වෙනත් ආයෝජන අත්කරගැනීම් යටතේ ආයෝජන ක්‍රියාකාරකම් ලෙස හඳුනාගෙන ඇත. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 හි 10.1 ඡේදය යටතේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාල මාර්ගෝපදේශ අංක 06 හි සඳහන් පරිදි ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කල යුතුයි. |
| (ii) | වර්ෂය තුල අත්තිකාරම් මුදලින් අයකර ගැනීම් රු 638,490.ක් වුවද එය ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ගණනය කිරිමේදී සැලකිල්ලට ගෙන නොතිබුණි. | වර්ෂය තුළ වැටුපෙන් අයකර ගන්නා ලද අත්තිකාරම් මුදල් මාස්පතා මහා භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත ප්‍රේෂණය කරන බැවින් අත්තිකාරම් අයකර ගැනීම් ශේෂය ආයෝජන ක්‍රියාකාරකම් ලෙස හඳුනාගත නොහැක. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 හි 10.1 ඡේදය යටතේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාල මාර්ගෝපදේශ අංක 06 හි සඳහන් පරිදි ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කල යුතුයි. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු කිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය තුල සමූපකාර සමිතිවල සේවකයන් සඳහා දැනුවත්කිරීමේ වැඩමුළු 12 ක් පැවැත්වීමටද, සේවක පැමිණිලි/අභියාචනා 36 ක් විසදීමටද, උපදෙස් ලබාදීම් 50 ක් සිදුකිරීමටද, සමූපකාර සමිති සඳහා බඳවාගැනීම් 30 ක් සිදු කිරීමටද සැලසුම් කර තිබුණද, දැනුවත් කිරීමේ වැඩමුළු 03 ක්ද, සේවක පැමිණිලි/අභියාචනා විසදීම් 11 ක්ද, උපදෙස් ලබාදීම් 27 ක්ද සිදුකර තිබු අතර සමූපකාර සමිති සඳහා බඳවාගැනිම් සිදුකර නොතිබුණි. | **Covid** – 19 වසංගත තත්වය හේතුවෙන් සෞඛ්‍ය හේතුන් මත සමූපකාර සමිති වලින් සේවකයින් රැස්කිරීමට අපහසු වීම**,**අභියාචනා වලට අදාලව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට එම සේවකයන් හා සමිතිවල නිලධාරීන් කැඳවීමට නොහැකි වීම හා 2020 ඔක්තෝම්බර් සිට කොමිෂන් සභාවේ සාමාජිකයන් ඉල්ලා අස්වීම. | වර්ෂය තුල ක්‍රියාකාරි සැලැස්මේ සඳහන් කාර්යයන් ඉටුකර ගැනීමට ක්‍රියාකල යුතුයි. |

**4. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 23 ක් වන අතර තත්‍ය කාර්ය මණ්ඩලය 18 කි. ඒ අනුව තනතුරු පුරප්පාඩු 05 ක් පවතින අතර පරිපාලන නිලධාරී තනතුර 2017 වර්ෂයේ නොවැම්බර් 30 දින සිට කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු අතර එය මේ දක්වා වසරින් වසර දීර්ඝ කරමින් පැවතුනි. | මෙම ආයතනයේ පවතින ද්විතියීක මට්ටමේ පුරප්පාඩු 05 ම ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ගේ පුරප්පාඩු වන බැවින් එම පුරප්පාඩු සම්පූර්ණ කරන ලෙස ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත වරින් වර ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව දන්වා තිබුණි. | අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කල යුතුයි**.** |